කැළණිය අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2016
ගණිතය

කාලය : පැය 2.00 යි   I කොටස   **7 වන ශ්‍රේණිය**

නම :..

පාසල :..

★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) $\frac{3}{4}$ ට තුල්‍ය භාග 2ක් ලියන්න.

(02) 7983 හි ඉලක්කම් දර්ශකය ලියන්න.

(03) 2.25 භාගයක් ලෙස ලියන්න.

(04) 12 හි සාධක සියල්ලම ලියන්න.

(05) $3x - 4 = 8$ සමීකරණය විසඳා x හි අගය සොයන්න.

(06) කිරි ලීටර් 13ක් මිලිලීටර් 150ක් සමාන භාජන 5කට දැමූ විට එක භාජනයක ඇති කිරි ප්‍රමාණය සොයන්න

(07) $3x + 2 = 7$ සමීකරණය සඳහා අදාල ගැලීම් සටහන අඳින්න.

(08) මෙය කුමන වර්ගයේ ත්‍රිකෝණයක්ද?



(09) (+3) + (-5) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් සුළු කරන්න.

(10) 24 හි සියළුම සාධක ලියන්න.

(11) දිග 10cm ද පළල 8cm ද උස 5cm ද වූ ඝනකාභයක පරිමාව සොයන්න.

(12) වෘත්තයක කේන්ද්‍රය හරහා ගමන් කරන පරිධි වෘත්තය මත ලක්ෂ 2ක් යා කරන රේඛාවක් හඳුන්වන නම කුමක්ද?

(13) 7 හි මුල් ගුණාකාර 3 ලියන්න.

(14) පාන් රාත්තල් 3ක 1/3 ඒවා කොපමණ තිබේද?

(15) $235.145 \div 5$ සුළු කරන්න

(16) $3x + 4y + 6x + 2y$ සුළු කරන්න.

(17) $2\frac{5}{8} - 1\frac{1}{4}$ සුළු කරන්න.

(18)



මෙම කෝණයේ ශීර්ෂය හා බාහු නම් කරන්න.

(19) 32 සංඛ්‍යාව පාද දෙකක් වූ දර්ශක අංකනයෙන් දක්වන්න.

(20) 6 හා 12 හි ම.පො.සා. සොයන්න.

ලකුණු - 2x20 = 40

II කොටස

★ ප්‍රශ්නය සියල්ලටම පිළිතුරු සපයන්න.
★ පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද ඉතිරි ප්‍රශ්න වලට ලකුණු 11 බැගින්ද හිමි වේ.

(01) (a) ශිෂ්‍යයකු විසින් කාඩ්බෝඩ් වලින් කපා ගත් සෘජුකෝණාස්‍රාකාර ආස්තර 2ක් හා සමචතුරස්‍රාකාර ආස්තරයක් පහත A, B, C රූප මගින් දැක්වේ.



(i) ඉහත A, B හා C රූප වල වර්ගඵලය වෙන වෙනම සොයන්න. (ලකුණු 3x2)

(ii) ඉහත රූප තුන භාවිතයෙන් උපරිම දිග හා පළල 15cm කට වැඩි නොවූ සංයුක්ත රූපයක දළ සටහනක් ඇඳ එහි මිනුම් ලකුණු කරන්න. (ලකුණු 2)

(iii) එම සංයුක්ත රූපයේ වර්ගඵලය සොයන්න. (ලකුණු 2)

(b) (i) පතුලේ වර්ගඵලය $36m^2$ වූ සෘජුකෝණාස්‍රාකාර පතුලක් සහිත ටැංකියක දිග හා පළල වශයෙන් ගත හැකි මිනුම් 2ක් ලියන්න. (ලකුණු 2)

(ii) මෙම ටැංකියේ පතුල සමචතුරස්‍රාකාර වුයේ නම් දිග හා පළල ලියා දක්වන්න. (ලකුණු 2)

(c) එදිනෙදා ජීවිතයේදී වර්ගඵලය භාවිතයට ගන්නා අවස්ථා 2ක් ලියන්න. (ලකුණු 2)

(02) (i) එක්තරා විභාගයක අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2015 ජූලි 11 වනදායි අයදුම්පත් භාරගන්නා දිනට අයදුම්කරුවන් අවු:18 සම්පූර්ණ කර තිබිය යුතුයි. 1993 පෙබරවාරි 15 දින උපන් කමල්ට මෙම විභාගයට පෙනී සිටිය හැකිදැයි එදිනට ඔහුගේ වයස සොයමින් පැහැදිලි කරන්න (ලකුණු 3)

(ii) 1990 වරශය අයත් වන දශකය, ශත වර්ෂය හා සහශ්‍ර වර්ෂය සදහන් කරන්න. (ලකුණු 3)

(ii) එකතු කරන්න (ලකුණු 3)

	දින	පැය	මිනිත්තු
	09	16	37
+	01	11	23

(iv) දිනයක ආරම්භය හා අවසානය සම්මත ක්‍රමයට ලියන්න. (ලකුණු 3)

(03) (a) තේ පැන් සංග්‍රහයකට ගෙන එන ලද පාන් වලින් පාන් රාත්තලක් පාන් පෙති 8කට කපන ලදි.

(i) සම්පූර්ණ 1ක් සමාන කොටස් 8කට බෙදා ඇති අයුරු රූප සටහනකින් දක්වන්න. (ලකුණු 1)

(ii) සම්පූර්ණ 1ක් සමාන කොටස් 8කට බෙදූ පසු එක් කොටසක් දැක්විය හැකි භාගය ලියා ඊට තුල්‍ය භාගයක් ලියන්න. (ලකුණු 2)

(iii) පාන් ගෙඩි $5\frac{1}{2}$ කින් කපා ගත හැකි එවන් පාන් පෙති ගණන සොයන්න. (ලකුණු 2)

(iv) තේ පානයෙන් පසු පාන් පෙති 9ක් ඉතිරි විය. එය භාගයක් ලෙස දක්වන්න. (ලකුණු 2)

(b) සුළු කරන්න

(i) $\frac{5}{12} + \frac{3}{4}$

(ii) $2\frac{3}{5} - 1\frac{1}{10}$ (ලකුණු 2)

(04) කම්බි රාමුවකින් සාදන ලද සමචතුරස්‍රයක් පැත්තක දිග x වේ.

(i) මෙම සමචතුරස්‍රාකර කම්බි රාමුවේ පරිමිතිය සොයන්න. (ලකුණු 2)

(ii) සමචතුරස්‍රයක පැත්තක දිග මෙන් දෙගුණයක දිගක් සහිත සමපාද ත්‍රිකෝණයක පරිමිතිය සොයන්න. (ලකුණු 3)

(iii) මෙම සමචතුරස්‍රය හා සමපාද ත්‍රිකෝණය යන දෙකම සෑදීමට අවශ්‍ය කම්බි වල මුළු දිග සොයන්න. (ලකුණු 3)

(iv) මෙම කම්බි වල මුළු දිග 80cm වේ නම් සමචතුරස්‍රය පැත්තක දිග හා සමපාද ත්‍රිකෝණයක පැත්තක දිග සොයන්න. (ලකුණු 3)

(05) (i) AB = 4 cm වූ රේඛා ඛණ්ඩයක් අඳින්න. (ලකුණු 1)

(ii) A හා B කේන්ද්‍ර ලෙසද AB අරය ලෙසද ගෙන වෘත්ත දෙකක් අඳින්න. (ලකුණු 2)

(iii) එම වෘත්ත ඡේදනය වන ලක්ෂ C හා D ලෙස නම් කරන්න. දෙකක් අඳින්න. (ලකුණු 2)

(iv) AC හා BC යා කිරීමෙන් ලැබෙන ත්‍රිකෝණය ලබා ගන්න. (ලකුණු 2)

(v) AC හා BC දිග මැනීමෙන් මෙය කුමන වර්ගයේ ත්‍රිකෝණයක් දැයි ලියන්න. (ලකුණු 2)

(vi) $C\hat{A}B$ අගය මැන ලියන්න. (ලකුණු 2)